## මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය

**ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය සඳහා මාසික කුලී ගෙවීමේ පදනම මත වසර 5ක කාලයක් සඳහා ගොඩනැඟිල්ලක් සපයා ගැනීමේ ප්‍රසම්පාදනය**

**ලංසු කැඳවීම - 2026**

**කොන්ත්‍රාත් අංකය - DIE/PRO/03/2026/52**

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

...............................................

නියෝජ්‍ය පාලක

රිසිට්පත් අංකය :

ලංසුකරුගේ නම :

දිනය :

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

**මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු**

**කටයුතුඅමාත්‍යාංශය**

SRI LANKA IMMIGRATION AND EMIGRATION

# ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

# ලංසු ආරාධනය

**ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය සඳහා මාසික කුලී ගෙවීමේ පදනම මත වසර 5ක කාලයක් සඳහා ගොඩනැඟිල්ලක් සපයා ගැනීමේ ප්‍රසම්පාදනය**

**කොන්ත්‍රාත් අංකය (IFB) : DIE/PRO/03/2026/52**

1. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මාතර ප්‍රාදේශීය කාර්යාලය සඳහා, මාසික කුලී ගෙවීමේ පදනම මත අවම වශයෙන් වසර 5ක කාලයක් සඳහා ගොඩනැඟිල්ලක් සපයා ගැනීමට යෝග්‍යතා පූර්ණ සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

2. මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට වැඩිමනත් විස්තර නියෝජ්‍ය පාලක (ප්‍රසම්පාදන), ප්‍රසම්පාදන අංශය, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, 05 වන මහල, "සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල (ඇමතුම් අංක : 011-2101515) යන ස්ථානයෙන් ලබා ගත හැකිය.
   ලංසු ලිපි ලේඛන ලබාගැනීම හා පරීක්ෂාව ඕනෑම වැඩ කරන දිනයකදී පෙ.ව.9.00 සිට ප.ව.3.00 දක්වා පහත ස්ථානයන්හිදී සිදු කළ හැකිය.

   - ප්‍රසම්පාදන අංශය, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, 05 වන මහල, "සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල
   - මාතර ප්‍රාදේශීය කාර්යාලය, අංක 9, ශ්‍රී විජය ගොඩනැගිල්ල, රාහුල පාර, මාතර

3. සේවාව සැපයීම: ගිවිසුම අත්සන් කරන දිනයෙන් වහාම.

4. ලංසුකරුවන් පහත අවම සුදුසුකම් මට්ටම් සපුරාලිය යුතුය.

   පිහිටීම :
   - මාතර ප්‍රධාන බස් නැවතුම්පලේ සිට ප්‍රධාන මාර්ගයක උපරිම කිලෝමීටර් දෙකක් (2km) ඇතුළත පිහිටා තිබිය යුතුය.
   - පොදු ප්‍රවාහන සේවා සපයා ගැනීමට හැකි සහ මහජනතාවට පහසුවෙන් ළඟාවිය හැකි ස්ථානයක් විය යුතුය.

   පහසුකම් :
   - 60 A හෝ ඊට වැඩි තෙකලා විදුලිය (වරලත් විදුලි ඉංජිනේරු සහතිකයක් තිබිය යුතුය)
   - ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලයේ ජල සැපයුමක් තිබීම හා අඛණ්ඩ ජල පහසුකම් ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් ස්ථාපනය කර තිබිය යුතුය.
   - කාර්යාලීය කාර්ය මණ්ඩලයේ මෝටර් රථ හා යතුරු පැදි නැවැත්වීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩ තිබීම. [අවම වශයෙන් වර්ග අඩි 600ක (අඩි 30 X අඩි 20) ප්‍රමාණයක්]

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

- ආරක්ෂක නිලධාරීන්ට රැඳී සිටීමට ගොඩනැඟිල්ලට යාබදව පිටතින් කුටියක් තිබීම.
- මහජනතාව සඳහා භාවිතා කිරීමට හැකි පරිදි අවම වශයෙන් වැසිකිලි දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් තිබීම.
- කාර්ය මණ්ඩලය සඳහා ගොඩනැඟිල්ලේ ඇතුලත අවම වශයෙන් වැසිකිලි දෙකක් වත් තිබිය යුතුය.
- විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා බාධක රහිත ප්‍රවේශයක් තිබීම අමතර සුදුසුකමක් වේ.
- අවම වශයෙන් වසර 5කට බදු දිය යුතුයි.
- නිරවුල් අයිතිය තහවුරු කළ යුතුය.

5. ඉඩකඩ අවශ්‍යතාවය :

| අංශය | විස්තරය | අවම වර්ග අඩි ප්‍රමාණය |
|---|---|---|
| ප්‍රධාන කාර්යාල පරිශ්‍රය | නිලධාරීන්ගේ රාජකාරි කටයුතු, විවේකාගාර, ලේඛනාගාර සහ රැස්වීම් ශාලා සඳහා | 4000 |
| මහජන රැඳී සිටීමේ ප්‍රදේශය | සේවාව ලබා ගැනීමට පැමිණෙන ජනතාව සඳහා රැඳී සිටීමට ප්‍රමාණවත් ඉඩකඩ සහ වාතාශ්‍රය සහිත ප්‍රදේශය | 1600 |

6. තාක්ෂණික ඇගයීම් කමිටුව මඟින්, ගොඩනැගිල්ලේ පිහිටීම, තත්ත්වය හා අවශ්‍යතාවයට ගැලපීම යන කරුණු පිළිබඳ සෑහීමකට පත්වුවහොත් පමණක්, රජයේ තක්සේරුව හා ලංසුකරුවන් ඉදිරිපත් කර ඇති තක්සේරුව යන දෙකෙන් අඩුම මිලට අදාළව අවම ලංසුව ඉදිරිපත් කළ ලංසුකරුට පිරිනැමීමේ ලිපිය (Letter of Award) නිකුත් කරනු ලැබේ. අවම ලංසුකරු විසින් යහපත් තත්ත්වයේ ගොඩනැගිල්ලක් සැපයීමට නොහැකි නම්, ගිවිසුම පිරිනැමීම සිදු නොවේ. රජයේ තක්සේරු වාර්තා ලබාගැනීමට වියදම් වන මුදල ලංසු කරුවන්ගෙන් අයකරනු ලැබේ.

7. සම්පූර්ණ ලංසු ලේඛන සමූහය සිංහල භාෂාවෙන්, ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා ආපසු නොගෙවිය හැකි රු. 1000/- ක ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් ලබා ගත හැක.

8. සම්පූර්ණ කරන ලද ලංසු, "මුල් පිටපත" (Original) හා "අනුපිටපත" (Duplicate) ලෙස පිටපත් 2කින් වෙන වෙනම කවරවල බහා මුද්‍රා තබා, ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ, ප්‍රධාන කාර්යාලයේ, 5 වන මහල, ප්‍රසම්පාදන අංශය, "සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල ලිපිනය වෙත, 2026 ජූලි 08 වන දින ප.ව. 02.00 ට හෝ එයට පෙර භාර දිය යුතුය. ප්‍රමාද වූ ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු කැඳවීම අවසන් වීමෙන් අනතුරුව, ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ (පැමිණීමට කැමති අය), 2026 ජූලි 08 වන දින ප.ව. 02.00 ට ලංසු විවෘත කරනු ලැබේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,**
**05 වන මහල, "සුහුරුපාය",**
**ශ්‍රී සුභූතිපුර පාර,**
**බත්තරමුල්ල.**

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

## I කොටස

**ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය සඳහා මාසික කුලී ගෙවීමේ පදනම මත වසර 5ක කාලයක් සඳහා ගොඩනැඟිල්ලක් සපයා ගැනීම**

**විස්තර හා කොන්දේසි පිළිබඳ මාර්ගෝපදේශය**

1. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය සඳහා ගොඩනැඟිල්ලක් බදු කුලී පදනමින් ලබා ගැනීම සඳහා ලංසු ඉදිරිපත් කිරීමේ දී පහත සඳහන් ලියවිලි නොඅඩුව හා සම්පූර්ණව ඉදිරිපත් කළ යුතු අතර ලංසු අයදුම්පත්‍ර හා සියළු ලේඛන යථා පරිදි සම්පූර්ණ කර අයදුම්කරු විසින් අත්සන් තැබිය යුතු අතර එලෙස සම්පූර්ණ කරන ලද ලංසු “මුල් පිටපත” (Original) හා “අනුපිටපත” (Duplicate) ලෙස පිටපත් 2කින් වෙන වෙනම කවරවල බහා මුද්‍රා තබා ඉදිරිපත් කළ යුතුය. මෙහි “මුල් පිටපත” සමඟ සියළුම ලියවිලිවල මුල් පිටපත් ඇමිණිය යුතු වේ.

   I. ගොඩනැගිල්ලේ අයිතිය තහවුරු කිරීම සඳහා ඔප්පුවේ පිටපත සහ අනෙකුත් ලේඛන (හිමිකම් වාර්තා).
   II. අදාල පළාත් පාලන ආයතනය / නාගරික සංවර්ධන අධිකාරිය (UDA) විසින් අනුමත කරන ලද ගොඩනැගිලි මහල සැලැස්ම.
   III. අදාල පළාත් පාලන ආයතනය / UDA විසින් නිකුත් කරන ලද අනුකූලතා සහතිකය (Certificate of Conformity).
   IV. NBRO සහතිකය තිබිය යුතුය. (නාය යෑම්/ ජලගැලීම් වලට ලක් නොවන ස්ථානයක් බවට)
   V. ලංසුකරු බද්ධ ව්‍යාපාරයක් (Joint Venture) නම්, JV ගිවිසුමේ හෝ අවබෝධතා ගිවිසුමේ (MOU) සහතික කළ / අනුමත කළ පිටපතක් ඉදිරිපත් කළ යුතු අතර, ලංසුකරු සීමිත වගකීම් සමාගමක් නම්, සමාගම් ලියාපදිංචි සහතිකයේ සහතික කළ / අනුමත කළ පිටපතක්ද, හවුල් ව්‍යාපාරයක් නම්, හවුල් ගිවිසුමේ සහතික කළ / අනුමත කළ පිටපතක්ද ඉදිරිපත් කළ යුතුය.
   VI. ලංසුකරු සතුව රජයේ තක්සේරු වාර්තාවක් ඇත්නම්, එය අනෙකුත් ලේඛන සමඟ ඉදිරිපත් කළ යුතුය.
   VII. අදාල අධිකාරියෙන් ලබාගත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ නිෂ්කාශන අනුමැතිය හෝ ඒ සම්බන්ධ ලේඛනමය සාක්ෂි.
   VIII. ඇඳීම් (Drawings)
      - ගොඩනැගිලි මහල සැලැස්ම සමඟ
         - දොර, ජනේල පිහිටීම
         - හදිසි පිටවීම් මාර්ග
      - සේවා ඇඳීම්
         - විදුලි ඇඳීම් (උපාංග, වයරින්)
         - ජලනල ඇඳීම් (අපද්‍රව්‍යජලය, මළජලය, වැසිජලය)
      - යාන්ත්‍රික ඇඳීම්
         - ගිනි හඳුනාගැනීම හා ආරක්ෂණ පද්ධති ඇඳීම්
         - වායුසමීකරණ නාලිකා (Air Conditioning Ducts)

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

2. එක් අයදුම්කරුවකු වෙනුවෙන් ඉදිරිපත් කළ හැකිවනුයේ එක් ලංසුපතක් පමණි. කුමන හෝ ආකාරයකින් ලංසුපත් එකට වඩා ඉදිරිපත් කර තිබේ නම් එසේ ඔවුන් විසින් ඉදිරිපත් කරනු ලබන සියලුම ලංසු අවංලගු කිරීමට යටත්වේ.

3. කොන්ත්‍රාත්තුව සඳහා ඉදිරිපත් කරනු ලබන මිල ගණන් ලංසුව ඉදිරිපත් කිරීමෙන් පසු වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. මෙම මිල ගණන් ලංසුව භාර ගැනීම අවසන් දින **(2026.07.08)** සිට දින 105ක කාලයක් දක්වා වලංගු විය යුතුය.

4. ලංසු පත්‍රය සමඟ රු.200,000.00ක් වටිනාකම ඇති ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය මඟින් ලියාපදිංචි කර ඇති රජය පිළිගත් වාණිජ බැංකුවකින් ආගමන හා විගමන පාලක ජනරාල් නමට නිකුත් කරන ලද, ලංසු භාර ගැනීම අවසන් දින සිට එනම් **2026.07.08 දින සිට 2026.11.18 දින දක්වා** දින 133ක කාලයකට වලංගුවන පරිදි ලබාගත් ඇමුණුම - 01 හි සඳහන් ආකෘතිය අනුව ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතුය.

5. ඉදිරිපත් කර ඇති ලංසු අයදුම්පත් තාක්ෂණ ඇගයීම් කමිටුව වෙත ඔවුන්ගේ නිර්දේශය සඳහා ඉදිරිපත් කරන අතර, අනතුරුව ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කමිටුව විසින් සාර්ථක අයදුම්කරු තෝරාගනු ඇත.

6. පශ්චාත් සුදුසුකම් අවශ්‍යතා (ITB 37.2)

- සාර්ථක ලංසුකරුගේ, ලංසු ලේඛනවල සපයා ඇති තොරතුරු සත්‍යාපනය කිරීම සහ අදාළ පරිශ්‍රය සේවායෝජකයාගේ අවශ්‍යතාවයන්ට සුදුසුද යන්න තීරණය කිරීම සඳහා සේවායෝජකයා විසින් එම පරිශ්‍රය නිරීක්ෂණය කිරීම සඳහා කටයුතු කරනු ලැබේ.
- ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ අවශ්‍යතා අනුව අවශ්‍ය වන අවස්ථාවලදී අදාළ පරිශ්‍රය තුළ හා පිටත සංශෝධන/වෙනස්කම්/ඉදිකිරීම් සිදු කිරීමට හැකියාව තිබිය යුතුය.

7. සාර්ථක අයදුම්කරු තෝරාගෙන ගිවිසුම අත්සන් කළ පසු ලංසු සුරක්ෂණය නිදහස් කරනු ලැබේ.

8. ලංසු සුරක්ෂණය නිදහස් කිරීමට පෙර, සාර්ථක අයදුම්කරු ලංසු පිළිගැනීමේ ලිපිය ලැබී වැඩ කරන දින 14 ඇතුලත කොන්ත්‍රාත්තුවේ වසරක වටිනාකමින් 5%ක වටිනාකම සහිත කාර්ය සාධන සුරක්ෂණයක් (ඇමුණුම - 02), සම්පූර්ණ ගිවිසුම් කාලය සඳහා හෝ වාර්ෂිකව අලුත් කිරීමේ පදනමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ලියාපදිංචි කර ඇති බැංකුවකින් ලබා ගෙන ඉදිරිපත් කළ යුතුය.

9. සාර්ථක ලංසුකරුට ලිඛිතව දැනුම් දුන් දින සිට වැඩ කරන දින 14ක් ඇතුලත එයට සාර්ථක ප්‍රතිචාර නොදක්වන ලද්දේ නම් ඊළඟ සාර්ථක ලංසුකරුට ලංසුව ලබාදීම පිළිබඳව සලකා

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

බැලීමට හා පළමු ලංසුකරුගේ ලංසු බැඳුම්කරය රාජසන්තක කිරීමට ආගමන හා විගමන පාලක ජනරාල්ට බලය ඇත. ලංසු ප්‍රදානය කිරීමෙන් පසුව සාධාරණ හේතු නොමැතිව එය භාරගැනීම ප්‍රතික්ෂේප කරන ලංසුකරුවන්, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ නියමයන්ට අනුව අසාධු ලේඛන ගතකිරීමට කටයුතු කරනු ඇත.

10. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීති රීති මෙම කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් ද බල පැවැත්වේ.

11. සාධාරණ හා නීත්‍යානුකූල හේතුන් මත මෙම ලංසුව පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ අවලංගු කිරීමේ බලය ආගමන හා විගමන පාලක ජනරාල් සතුය.

12. ගිවිසුම්ගත වීමෙන් පසු ගොඩනැඟිල්ල වෙනත් කෙනෙකුට පැවරීම හෝ අතුරු බදු දීම තහනම්ය.

13. ලංසුපත්වල සඳහන් යම් දෙයක් වෙනස් කරන්නේ නම් එය තනි ඉරකින් කපා එසේ වෙනස් කරන සෑම ස්ථානයකම ලංසුකරුගේ කෙටි අත්සන යෙදිය යුතුය.

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

## II කොටස

**ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය සඳහා මාසික කුලී ගෙවීමේ පදනම මත වසර 5ක කාලයක් සඳහා ගොඩනැඟිල්ලක් සපයා ගැනීම**

**ලංසු පිරිවිතරයන්**

| | | | |
|---|---|---|---|
| 1. අයිතිකරුගේ නම :- | | | |
| 2. ලිපිනය :- | | | |
| 3. සම්බන්ධතා විස්තර :- | | දුරකථනඅංක :- | ඊ-තැපැල :- |
| 4.ගොඩනැගිල්ල / නිවස පිහිටි ස්ථානය :- | | ලිපිනය :- | දුරකථනඅංක :- |
| 5.ප්‍රධාන මාර්ගයෙන් ඇති දුර සහ පිවිසුම් මාර්ග පිළිබඳ විස්තර :- | | | |
| 6. ගොඩනැගිල්ලේ වර්ග ප්‍රමාණය, ශාලා, කාමර සංඛ්‍යාව සහ එවැනි විස්තර:- | | වර්ගඅඩි (Sq.ft.) | වෙනත්පහසුකම් |
| ශාලා | 1 | | |
| | 2 | | |
| කාමර සංඛ්‍යාව | 1 | | |
| | 2 | | |
| | 3 | | |
| | 4 | | |
| | 5 | | |

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

| | | |
|---|---|---|
| වැරන්ඩා | | |
| කුස්සිය/පැන්ට්‍රිය | | |
| බැල්කනි | | |
| වෙනත් ප්‍රදේශ | | |
| මුළු බිම් වර්ග ප්‍රමාණය | | |
| 7. නාන කාමර සංඛ්‍යාව:- | වැසිකිලි සංඛ්‍යාව:- | |
| 8 ආරක්ෂක සීමාව පිළිබඳ විස්තර (පැරපට් බිත්ති/ කම්බිවැට/ ගේට්ටුව/ CCTV):- | | |
| 9. වාහන නවතා තැබිය හැකි සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය | වාහන සංඛ්‍යාව | |
| | දිග (වර්ගඅඩි) | පළල (වර්ගඅඩි) |
| 10. විදුලි හා ජලසැපයුම් පිළිබඳ විස්තර: | | |
| 11. මාසික කුලී/ ලීස් මුදල:-<br>(VAT රහිතව) | | |
| 12. අපද්‍රව්‍ය ඉවත් කිරීම පිළිබඳ විස්තර:- | | |
| 13. වෙනත් පහසුකම් : (විදුලි සෝපාන ආදිය) | | |

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

**III කොටස**

**ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය සඳහා මාසික කුලී ගෙවීමේ පදනම මත වසර 5ක කාලයක් සඳහා ගොඩනැඟිල්ලක් සපයා ගැනීම**

**ලංසු ඉල්ලුම්පත**

**<u>ලංසු ආකෘති පත්‍රය</u>**

1. ලංසුකරුගේ නම: ........................................................................................................
(පෞද්ගලික ව්‍යාපාරයක් නම්, අයිතිකරුගේ සම්පූර්ණ නම, සීමා සහිත පෞද්ගලික සමාගමක් නම් සමාගමේ නම)

2. ලිපිනය:...........................................................................................................................
(පෞද්ගලික ව්‍යාපාරයක් නම්, අයිතිකරුගේ ව්‍යාපාරික ලිපිනය, සීමා සහිත පෞද්ගලික සමාගමක් නම් සමාගමේ ව්‍යාපාරික ලිපිනය)

3. දුරකථන අංකය : ..................................... ෆැක්ස්: .......................................

4. ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ අංකය හා දිනය : ...........................................................
(ලියාපදිංචි කිරීමේ සහතිකයේ සහතික කළ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.)

5. සේවා සැපයීම සඳහා මාසිකව ඉල්ලුම් කරන මුළු මුදල

| කාලය | වාර්ෂික කුලිය<br>බදු රහිත (රුපියල්) |
|---|---|
| පළමු වසර | |
| දෙවන වසර | |
| තෙවන වසර | |
| සිව්වන වසර | |
| පස්වන වසර | |

6. සේවා අවශ්‍යතාවය මත කොන්ත්‍රාත්තුවේ ගිවිසුම් කාලය දීර්ඝ කිරීම සඳහා ඔබ එකඟ වන්නේ ද?
.......................................................................................................................................

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

7. ආදායම් බදු හෝ රජයට ගෙවිය යුතු බදු මුදලක් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් ඔබ ආයතනය අධිකරණයේ දී වරදකරු වී තිබේ ද? ........................................

මා විසින් ඉහත සඳහන් කරන ලද තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් ප්‍රකාශ කරමි. තවද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පවත්නා නීති රීතිවලට හා කලින් කල හඳුන්වා දෙනු ලැබිය හැකි නීති රීතිවලට එකග වන බව ද, ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පවත්නා නීති රීතිවලට හා කලින් කලට හඳුන්වා දෙනු ලැබිය හැකි නීති රීති හා කොන්දේසිවලට එකඟ වන බවද ප්‍රකාශ කර සිටිමි. මාගේ සේවා සැපයුමේ අසාර්ථකභාවය හෝ ලංසු කොන්දේසි හෝ වෙනත් නීති රීති උල්ලංඝනය කිරීම යන ඕනෑම කාරණයක් හේතු කොටගෙන මගේ සේවා සැපයුම අවලංගු කිරීමට හෝ වෙනත් දඬුවමකට යටත් වීමට එකඟ වන බව ද ප්‍රකාශ කර සිටිමි.

ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය: ..........................................................................................

අත්සන: .............................................

(නිල මුද්‍රාව)

ජාතික හැඳුනුම්පත් අංකය: ....................................

**සාක්ෂි**

1. නම: ................................................................

   ජාතික හැඳුනුම්පත් අංකය: ..................................

   අත්සන: ..........................................................

2. නම: ................................................................

   ජාතික හැඳුනුම්පත් අංකය: ..................................

   අත්සන: ..........................................................

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

# Bid Security Guarantee

*(This Bank Guarantee form shall be filled in accordance with the instructions indicated in brackets)*

---*(Insert issuing agency's name and address of issuing branch or office)*-------

| | |
|---|---|
| ** Beneficiary:* | *Controller General, Dept. of Immigration & Emigration,* |
| | *Suhurupaya, Sri Subhuthipura Road, Battarmulla,* |
| *Date* | -----------*(Insert (by issuing agency) date)* |
| *Bid Guarantee No.:* | *……………………* |

We have been informed that*)…………………….* (Hereinafter called "the Bidder") has submitted to you his bid dated ----------------------*(insert (by issuing agency) date) (hereinafter called "the Bid")* for the supply of…………………………………… *(Insert name of Supplier)* under Invitation for Bids No. ---------------- *(insert IFB number)* ("IFB")

Furthermore, we understand that, according to your conditions, bids must be supported by a Bid Guarantee. At the request of the Bidder, we -------------------*(insert name of issuing agency)* hereby irrevocably undertake to pay you any sum or sums not exceeding in total an amount of ----------------------*(insert amount in figures)* --------------- -----*(insert amount in words)* upon receipt by us of your first demand in writing accompanied by a written statement stating that the Bidder is in breach of its obligation(s) under the bid conditions, because the Bidder:

(a) has withdrawn his Bid during the period of bid validity specified; or

(b) does not accept the correction of errors in accordance with the Instructions to Bidders (hereinafter "the ITB"); or

(c) having been notified of the acceptance of its Bid by the Purchaser during the period of bid validity, (i) fails or refuses to execute the Contract Form, if required, or (ii) fails or refuses to furnish the Performance Security, in accordance with the ITB

This Guarantee shall expire: (a) if the Bidder is the successful bidder, upon our receipt of copies of the Contract signed by the Bidder and of the Performance Security issued to you by the Bidder; or (b) if the Bidder is not the successful bidder, upon the earlier of (i) our receipt of a copy of your notification to the Bidder that the Bidder was unsuccessful, otherwise it will remain in force up to ----------------------- (*insert date)*

Consequently, any demand for payment under this Guarantee must be received by us at the office on or before that date-----------------------------------------------

*(Signature (s) of authorized representative(s)*

*****Bid guarantee should submit in the given format. Alternative formats are not be accepted**

# Performance Security

*[Note: the purchaser is required to fill the information marked as"*" and delete this note prior to selling of the bidding document]*

*[The issuing agency, as requested by the successful Bidder, shall fill in this form in accordance with the instructions indicated]*

--------------- *[Issuing Agency's Name, and Address of Issuing Branch or Office]* -------------

***Beneficiary:** *Department of Immigration & Emigration*

Date**: -------------------------**

**PERFORMANCE GUARANTEE No.:-------------------------**

We have been informed that --------------------------------------------------------------------------- *[Name of Supplier]* (hereinafter called "the Supplier") has entered into Contract No. ------------- *[Reference number of the contract]* dated --------------with you, for the -------------supply of ----------------------------------- *[name of contract and brief description]* (hereinafter called "the Contract").

Furthermore, we understand that, according to the conditions of the Contract, a performance guarantee is required.

At the request of the Supplier, we ------------------------- *[name of Agency]* hereby irrevocably undertake to pay you any sum or sums not exceeding in total an amount of-----------------------------

*[Amount in figures]*(-------------------------) *[amount in words]*, such sum being payable in the types and proportions of currencies in which the Contract Price is payable, upon receipt by us of your first demand in writing accompanied by a written statement stating that the Contractor is in breach of its obligation(s) under the Contract, without your needing to prove or to show grounds for your demand or the sum specified therein.

This guarantee shall expire, no later than the----------day of ----------20---------- *[insert date, 28 days beyond the scheduled completion date including the warranty period]* and any demand for payment under it must be received by us at this office on or before that date.

---------------------------------

[Signature(s)]

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව